GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 2055415 / 0718552552
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

# කොරෝනා (COVID 19) රෝගයේ ශ්‍රී ලංකාවේ වර්තමාන තත්ත්වය පිළිබඳව
# 2020 මාර්තු 24 (ප.ව 4.00) වාර්තාව

1. අප රට තුලට මේ වන විට COVID 19 වෛරසය පැමිණ ඇත. දැනට අප හට කල හැක්කේ වෛරසය රට තුල තවදුරටත් පැතිරීම වලක්වා ගැනීම හා වෛරසයෙන් සිදුවන හානිය වලක්වා ගැනීම පමණි.

2. දැනට රෝගීන් 99 දෙනෙකු රෝහල් ගතව ප්‍රතිකාර ලබමින් සිටී. ඉන් රෝගීන් දෙදෙනෙක් දැඩි සත්කාර ඒකක වල ප්‍රතිකාර ලබයි. තවද මේ වන විට රෝගීන් දෙදෙනෙක් සම්පූර්ණ සුවය ලබා රෝහලින් පිටව ගොස් ඇත.

3. ඉහත රෝගීන් සමග ස්පර්ෂක සබදතා පැවති පුරවැසියන් 19,000 ක් සෞඛ්‍ය, ආරක්ෂක හා පරිපාලන අංශ වල නිරෝධායන නිරික්ෂණය යටතේ රට පුරා විසිරි සිටී.

4. මේ වන විට රෝගීන් ගුවන් තොටුපල හා වරායෙන් රට තුලට ඇතුලු වීම අපගේ ඉල්ලීම පරිදි අතිගරු ජනාධිපතිතුමා විසින් සම්පූර්ණයෙන්ම නවතා ඇත.

5. අප හට සිදු කල හැක්කේ රෝහල් ගතව ප්‍රතිකාර ලබන රෝගීන්ගෙන් හා රෝග ස්පර්ෂක යැයි සැක කෙරෙන පුද්ගලයන්ගෙන් තවත් පිරිසකට රෝගය පැතිරීම වැලැක්වීම පමණි.

6. මෙවන් බෝ වන රෝගයක් සඳහා සිදු කරන ප්‍රතිකාර ක්‍රම තුන් ආකාරයකින් වර්ග කල හැක.
   I. රෝගය තවදුරටත් පැතිරීම වැලැක්වීම.
   II. නිශ්චිත රෝගී ප්‍රතිකාරය
   III. රෝගයෙන් ඇතිවන සංකූලතා කලමණාකරණය කිරීම.

7. ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් බෝවන රෝගයක අවස්ථා 04 ක් හදුනා ගනී.
   I. රෝගීන් නොමැති අවස්ථාව (No cases)
   II. අහඹුලෙස හමුවන රෝගීන් (Sporadic cases)
   III. සමුහ ලෙස හමුවන රෝගීන් (Clusters) - සමුහ ලෙස හමුවන රෝගීන් වර්ග 02 කි.
      a) නිවසේ සමුහ (Home Clusters)
      b) කුඩා කණ්ඩායම් සමුහ (Small Group Clusters)
   IV. රෝගය සමාජය තුල පැතිරීමේ අවස්ථාව (Community Transmission)

- **දැනට අප රට පවතින්නේ III හී a අවස්ථාවේය.**

GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 2055415 / 0718552552
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

8. ඇදිරි නීතිය අවස්ථාවේදී අප III හී a අවස්ථාවේ සිටියත් ඇදිරි නීතිය ලිහිල් කිරීමේදී එය III හී b හෝ IV මට්ටම දක්වා වර්ධනය වීමේ අවධානමක් ඇත.

9. අපගේ පලමු වන රෝගියා මාර්තු 11 වන දින වාර්තා විය. ඒ අනුව අද මාර්තු 24 වන 14 වන දිනය (Day 14) ලෙස හැදින්විය හැක.

10. දැනට අප රට තුල COVID 19 ආසාදිත රෝගීන් කණ්ඩායම් දෙකකි.
    I. PCR පරික්ෂාව මගින් තහවුරු කර ගත් රෝගීන් (Confirmed Cases)
    II. PCR පරික්ෂාවකට මෙතෙක් ලක් නොවූ වෛරසය ආසාදනය වූ හදුනා නොගත් රෝගීන්. (Actual number of cases) (සැබෑ රෝගීන් සංඛ්‍යාව)

11. අද වන විට (Day 14) රෝගීන් 101 දෙනෙක් PCR පරික්ෂාවෙන් තහවුරු වී ඇත.

12. ඇමරිකාවේ John Hopkins රෝහල මූලික කරගෙන, චීනයේ හුබෙයි ප්‍රාන්තයට අදාලව සිදු කරන ලද ප්‍රක්ෂේපනයන්ට අනුව PCR පරික්ෂාව මගින් තහවුරු කර ගත් රෝගීන් මෙන් 8 ගුණයක රෝගීන් සංඛ්‍යාවක් සමාජය තුල සංසරණය වේ. ( එනම් 10. I රෝගීන් මෙන් 8 ගුණයක රෝගීන් සංඛ්‍යාවක් 10. II කණ්ඩායම නියෝජනය කරයි.)

13. දැනට අප රටේ තහවුරු වූ රෝගීන් 101 දෙදෙනාගෙන් රෝගීන් 32 ක් ගුවන් තොටුපලේදීම නිරෝධායනයට ලක් කල නිසා සමාජ ගත ව ඇති තහවුරු කර නොගත් රෝගීන් ගණන ඉහත 12 ට අනුව දල වශයෙන් 550 ක් වේ යැයි විද්‍යාත්මකව අනුමාන කල හැක. මෙම රෝගීන් ගෙන් කොටසක් නිරෝධායන මධ්‍යස්ථාන වල හෝ නිවෙස්වල නිරෝධායන තත්ත්වය යටතේ සිටිය හැක. [(101-32) X8 = 552]

14. මෙම රෝගීන් 550 සමග ස්පර්ෂ වූවා යැයි සලකමින් ආයතනික හෝ නිවාස තුල නිරෝධායන නිරික්ෂණ මට්ටමින් පුරවැසියන් 19000 ක් සිටී. ඒ නිරික්ෂණ සදහා ආරක්ෂක අංශ හා පරිපාලන ව්‍යුහයන්ගේ සහයද ලැබී ඇත.

15. මෙම පිරිස රට පුරා ව්‍යාප්තව සිටිය හැකි බැවින් අවධානම මුලු රටටම බලපා ඇති මුත් වැඩි රෝගීන් සංඛ්‍යාවක් වාර්ථා වූ කොළඹ, කලුතර, ගම්පහ සහ පුත්තලම යන දිස්ත්‍රික්ක දැඩි අවදානම් කලාප ලෙස හැදින්විය හැක.

16. මාර්තු 15 වන දින දක්වා රට තුල රෝගීන්ගේ සම්පූර්ණ සංචරණයක් සිදු වූවා යැයි සැලකිය හැක. (සමාජ දූරස්ථකරණයක් - Social Distancing ඒ දක්වා සිදුව නොමැත).

GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 2055415 / 0718552552
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

17. මාර්තු 16 වන දින සිට මාර්තු 19 වන දා දක්වා කාලය තුල ගුවන් තොටුපල වසා දැමීම, නිවාඩු දීම, පාසල් වසා දැමීම වැනි ක්‍රියාමාර්ග හේතු කොටගෙන සමාජය තුල 50% ක පමණ සමාජ දුරස්ථකරණයක් සිදු වූවා යැයි සැලකිය හැක.

18. මාර්තු 20 වන දින සිට රට තුල ඇඳිරි නීතිය පැන වීමත් සමග සමාජ දුරස්ථකරණය 75% දක්වා වර්ධනය වූයේ යැයි සැලකිය හැක.

19. සමාජ දුරස්ථකරණයක් නොමැති අවස්ථාවක සිදුවන නිදහස් සංචරණයේදී එක් පුද්ගලයෙකු නිසා දින 30 කදී අනුමාන වශයෙන් තවත් පුද්ගලයන් 500 දෙනෙකුට පමණ රෝගය පැතිරවීමට හැකිමුත් 50% ක දුරස්ථකරණයේදී එක් පුද්ගලයෙකුට දින 30 කදී අනුමාන වශයෙන් තවත් පුද්ගලයින් 15 කටද, 75% පමණක්ද දක්වා දුරස්ථකරණයත් සමග එක් රෝගියෙකුගෙන් රෝගය පැතිරීමේ හැකියාව දින 30 කදී රෝගීන් 2.5 කටත් සීමා කිරීමට හැකි බව තාක්ෂණිකව කරුණු ඔස්සේ අනුමාන කල හැක.

20. ඇඳිරි නීතිය ලිහිල් කිරීමත් සමග සමාජ දුරස්ථකරණය දැඩි ලෙස බිඳ වැටෙන බව පැවසිය හැක.

21. <u>මේ සියලු කාරණා සැලකීමේදී අනාගතය ගැන පහත **පුරෝකථනයක්** ඉදිරිපත් කල හැක</u>.

   I. සමාජ දුරස්ථකරණය **<u>අසාර්ථකව</u>** සිදු කල බටහිර රටවල දත්ත සැලකීමට භාජනය කල විට අප රටේ මාර්තු 25 වන දා සිට අප්‍රේල් 07 වන දා දක්වා කාලය තුල රෝගීන් සංඛ්‍යාවේ විශාල වැඩි වීමක් බලාපොරොත්තු විය හැක. නමුත් ලංකාවේ පුරවැසියන්, බලධාරීන් ලබාදුන් සෞඛ්‍ය උපදෙස් අකුරටම පිලිපැදහොත් අපට ඉදිරි සති දෙක තුලදී සතුටුදායක ප්‍රවණතාවයක් අපේක්ෂා කල හැක.

   II. කිසියම් අයුරකින් රට තුල **<u>අසතුටුදායක</u>** ප්‍රවනතාවයන් වර්ධනය වුවහොත්

      a. රටේ සීමිත භෞතික සම්පත් වල සීමාව ඉක්මවා ගිය හැක.

      b. යම් ලෙසකින් පුරවැසියන්ගේ වගකීම් විරහිත හැසිරීම් මත සෞඛ්‍ය සේවකයන් නිරෝධායනයට ලක් කිරීමට සිදු වුවහොත් සෞඛ්‍ය මානව සම්පත් ධාරිතාව මෙතෙක් කිසි දිනක අත් නොවිදි ලෙසින් අඩු විය හැක. වෙනත් වචන වලින් කිවහොත් රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා සෞඛ්‍ය කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවනු ඇත.

THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
ESTABLISHED IN 1926
TU No. 291
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 2055415 / 0718552552
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

එබැවින් ඉහත සියලු කරුණු සලකා බලා රටේ සියලුම පුරවැසියන්ගෙන් පහත සඳහන් ඉල්ලීම් කිරීමට කැමැත්තෙමු.

<u>ජන ජීවිතය පවත්වාගෙන යාමේදී පහත කරුණු වලට අවධානය යොමු කරන්න.</u>

I. මුදල් - බැංකු හා මූල්‍ය ආයතන මගින් කටයුතු කිරීමේදී සමාජ දුරස්ථභාවය පවත්වාගෙන යාම සිදු කල යුතුය. (ඇමුණුම -1)

II. විදුලි සලාක - ඇඳිරි නීතිය පවතින අවස්ථාවන්හිදී විදුලි සලාක ලබා දීම සඳහා රජයේ නිල ආපදා කළමණාකරණ යාන්ත්‍රණය ක්‍රියාත්මක කල යුතුය. මෙමගින් නිවෙස් වලටම විදුලි සලාක ලබා දීමේ යාන්ත්‍රණයක් දිස්ත්‍රික් ලේකම් ගේ මෙහෙය වීමෙන් සෞඛ්‍ය, පොලිස් හා හමුදාවන්ගේ සහභාගිත්වයෙන් සිදු විය යුතුය. මෙහිදි නිවාරණ සෞඛ්‍ය උපදෙස් පිළි පැදීම අනිවාර්යෙන්ම සිදු කල යුතුය.

III. එළවලු හා පළතුරු වැනි දෑ ගොවින්ගෙන් මිලදී ගැනීමටත්, නිවෙස් වලට බෙදා හැරීමටත් ඉහත අංක II හි සඳහන් යාන්ත්‍රණයම ක්‍රියාත්මක කල යුතුය.

IV. රෝගින් සඳහා අවශ්‍ය ඖෂධ ලබාදීම සඳහා යාන්ත්‍රණයක් සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කල යුතුය.

V. රෝගින් ගේ ඖෂධ ඇණවුම් සඳහා දුරකථන සමාගම් සමග සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් කටයුතු සම්පාදනය කල යුතුය.

VI. ඇඳිරි නිතිය යටතේ දින ගණනාවක් නිවෙස් තුල රැදි සිටීමට සිදුවීම නිසා ඒ සඳහා උපදෙස් මාලාවන් රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය විසින් මේ සමග ඉදිරිපත් කරනු ඇත.

**රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය**
**2020/03/24 (සවස 4.00)**